# අභිලාෂය ප්‍රකාශකිරීම සඳහා ආරාධනයයි

ශ්‍රී ලංකා මහ බැංකුව
இலங்கை மத்திய வங்கி
CENTRAL BANK OF SRI LANKA

## අති නවීන මූල්‍ය වෙළඳපොළ යටිතල පහසුකම් පද්ධතියක් සහ අවශ්‍ය නීතිමය සහ නියාමන රාමුවක් ස්ථාපිත කිරීම සඳහා උපදේශන සේවා සැපයීම

### හැඳින්වීම

1949 අංක 58 දරන මුදල් නීති පනත යටතේ 1950 දී පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකාවේ මූල්‍ය පද්ධතියේ කේන්ද්‍රීය ස්ථානය උසුලනු ලබන ආයතනයයි. මූල්‍ය වෙළඳපොළ, මූල්‍ය උපකරණ, මූල්‍ය ආයතන සහ මූල්‍ය යටිතල පහසුකම්වලින් සැදුම්ලත් කාර්යක්ෂම මූල්‍ය පද්ධතියක් පවත්වාගෙන යෑම ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන පරමාර්ථයක් වේ. මීට අමතරව මූල්‍ය පද්ධතියේ ක්‍රියාකාරීත්වය ඵලදායී ලෙස පවත්වාගැනීමට අවශ්‍ය නීතිමය සහ නියාමන රාමුවක් පවත්වාගෙන යෑම ශ්‍රී ලංකා මහ බැංකුවේ වගකීමක් වේ.

### ව්‍යාපෘතිය

මූල්‍ය පද්ධති යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ අඛණ්ඩ ක්‍රියාවලියේ එක් කොටසක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දේශීය මූල්‍ය වෙළෙඳපොළ තුළ විද්‍යුත් ගනුදෙනු සිදුකිරීම සහ එසැනින් එම ගනුදෙනු සැකසීම සඳහා පහසුකම් සැළසීමට අති නවීන විද්‍යුත් වෙළෙඳ පද්ධතියක් (Electronic Trading Platform) සහ මධ්‍යම ප්‍රතිපාර්ශව (Central Counterparty) නිෂ්කාශන හා පියවීම් පද්ධතියක් සහ මධ්‍යම සුරැකුම්පත් තැන්පතු ක්‍රමයක් (Central Securities Depository) ස්ථාපනය කිරීමට සැළසුම් කෙරේ.

### අරමුණු

ව්‍යාපෘතිය අරමුණු සමූහයකින් සමන්විත වන අතර, නිසි ලෙස කළමනාකරණය කරන ලද පියවීම් සහ ප්‍රතිපාර්ශව අවදානම් තුළින් කාර්යක්ෂම මිල අනාවරනයට පහසුකම් සැළසීම සඳහා දේශීය මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් පුළුල් කිරීම සහ මූල්‍ය පද්ධති ස්ථායිතාවය තහවුරු කිරීම සඳහා ආයෝජකයන්ට වඩා ඉහළ ආරක්ෂණයක් සැළසීම ප්‍රධාන ලෙස ඇතුළත් වේ.

### සුදුසුකම් ලැබීමේ නිර්නායකයන්

රජයේ සුරැකුම්පත් හෝ ඊට සමාන ණය උපකරණයන් සඳහා වූ ස්වයංක්‍රීය වෙළෙඳ පද්ධතියක් (Electronic Trading Platform), මධ්‍යම ප්‍රතිපාර්ශ්වික (Central Counterparty) නිෂ්කාශන සහ ගනුදෙනු පියවීම සඳහා නිෂ්කාශනාගාර පහසුකම් සහ මධ්‍යම සුරැකුම්පත් තැන්පතු ක්‍රමයක් (Central Securities Depository) ආවරණය වන පරිදි මෘදුකාංග සහ පරිගණක පද්ධති සැපයීම සහ නඩත්තු කිරීම සම්බන්ධයෙන් උපදේශන සේවාවන් දැනටමත් තනි තනිව හෝ සාමූහිකව සිදුකරන ආයතන (firm), සමූහ ආයතන (Consortium) හෝ බද්ධ ව්‍යාපාර (Joint Venture) වශයෙන් උපදේශන සේවා සපයා ඇති ලංසු තබන්නන් අභිලාෂ ප්‍රකාශ ඉදිරිපත් කිරීමට සුදුසුකම් ලබයි.

ලංසු තබන්නන් ව්‍යාපෘතියට අදාළ වන සමාන හා සැසඳිය හැකි සක්‍රිය ව්‍යපෘති එකක් හෝ කිහිපයක් සඳහා උපදේශන සේවා සපයා තිබීම අනිවාර්ය වේ. තවද එවැනි ව්‍යාපෘතිවල නිරතව සිටින සිය ජ්‍යෙෂ්ඨ උපදේශකවරුන් යෝජිත ව්‍යාපෘතිය අවසන් වනතුරු ක්‍රියාකාරීව සහභාගී කරවීමට ලංසු තබන්නන් සූදානම්ව සිටිය යුතු වේ.

### අභිලාෂ ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුතු ආකාරය

ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියෙන් **(https://www.cbsl.gov.lk)** බාගත කළ හැකි **"අභිලාෂ ප්‍රකාශයන් කැඳවීම"** / **"Request for Expression of Interest"** හි ඇති උපදෙස්වලට අනුව අභිලාෂ ප්‍රකාශයන් ඉදිරිපත් කළ යුතු වේ.

මෙම යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ වැඩි විස්තර **project.cmd@cbsl.lk** වෙත විද්‍යුත් තැපෑලෙන් ඉල්ලීමක් කිරීම මගින් ලබාගත හැක. විමසීම් සඳහා වන පිළිතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පළ කෙරෙනු ඇත.

ලංසුකරුවන් විසින් තම අභිලාෂ ප්‍රකාශයන් **2018 ජූලි මස 06** වැනි දින ශ්‍රී ලංකාවේ වේලාවෙන් **සවස 3.00ට ප්‍රථම** පහත ලිපිනය වෙත යොමු කළ යුතු වේ.


**රාජ්‍ය ණය අධිකාරී භාරයේ, සභාපති – අමාත්‍යමණ්ඩලය පත් කළ උපදේශන ප්‍රසම්පාදන කමිටුව**

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

අංක. 30, ජනාධිපති මාවත, කොළඹ 01, 00100, ශ්‍රී ලංකාව.